# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2441/15 - 2025 ජූනි මස 18 වැනි බදාදා - 2025.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. වී. 17745 දරන සහ මිලේනියම් ඩ්‍රයිව්, අයි. ටී. පාර්ක්, මාලඹේ, 10115 යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2024 සැප්තැම්බර් මස 25 දින අංක 2403/17 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ, එහි I වන තීරයේ දැක්වෙන "පූර්ව ළමාවිය අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධිය" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනේ කෙටි යෙදුමට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිත දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් සහ මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී, අවම අධ්‍යයන සම්භාර 120 ක් සහිත (එස්. එල්. කියු. එෆ්. 6 වන ස්ථරයේ) ජාල ආරක්ෂාව සහ වෝහාරික විද්‍යාව පිළිබඳ පරිගණක විද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන්,

   (අ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව විෂය ධාරාවෙන් හෝ ඉංජිනේරු තාක්ෂණය විෂය ධාරාවෙන් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එක්වර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ආ) නිශ්චිත බලධරයා විසින් අනුමත කරන ලද ඇදුනු පාඨමාලාවක් සමග ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් (සී) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම ; හෝ

(ඇ) ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගයේ දී කවර හෝ විෂය ධාරාවකින් අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ (එස්) තුනක් (3) ක් එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ එම අවස්ථාවේදී හෝ වෙනත් අවස්ථාවකදී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විෂයය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් (එස්) හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම සහ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් (සී) ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම.

යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. උපාධි ප්‍රදානය කිරීමේ තත්ත්වය ප්‍රදානය කිරීමේ දින සිට වසර දෙකක් ඇතුළත ආයතනය අවශ්‍ය පර්යේෂණ ධාරිතාව සපුරාලීමට යටත් විය යුතුය.

3. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (5) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිය පිරිනැමීම සඳහා සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධිය* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ජාල ආරක්ෂාව සහ වෝහාරික විද්‍යාව පිළිබඳ පරිගණකවිද්‍යා විද්‍යාවේදී ගෞරව උපාධිය | බීඑස්සී ගෞරව පරිගණකවිද්‍යා (ජාල ආරක්ෂාව සහ වෝහාරික විද්‍යාව) |

ආචාර්ය **හරිනි අමරසූරිය,**
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය.

2025 ජුනි මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 06 - 0131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.